**මාධ්‍ය නිවේදනය**

2026 අගෝස්තු මස 09 වැනිදා, කොළඹදී ය.

## 2027 අයවැයට කලින් Budget Proposal Hub නැවතත්

### අයවැයට යෝජනා ඉදිරිපත් කරන්න ජනතාවට ආරාධනා

ජාතික අයවැයට ජනතා යෝජනා ඉදිරිපත් කිරීම පහසු කරමින් වෙරිටේ රිසර්ච් ආරම්භ කළ පුරෝගාමී Budget Proposal Hub වේදිකාවේ දෙවන අදියර, 2027 අයවැය ඉලක්ක කරගනිමින් දැන් ක්‍රියාත්මකව ඇත.

Budget Proposal Hub යනු ජාතික අයවැයේ ජනතා නියෝජනය ඉහළ නැංවීමට වෙරිටේ රිසර්ච් ආරම්භ කළ නව වේදිකාවක් වන අතර, එසේ ඉදිරිපත් වන යෝජනා රජයේ අවධානයට යොමු කිරීම මෙම වේදිකාවේ අරමුණයි.

2026 වසරේ දී, මුලින්ම ආරම්භ කරන ලද මෙම වේදිකාවට ජනතාවගෙන් ඉදිරිපත් වූ අයවැය යෝජනා අතර, ලංකා කුරුඳු යොදාගනිමින් ඖෂධීය සංරචක නිෂ්පාදනය කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් ස්ථාපිත කිරීමේ සිට සෑම බස් නැවතුම්පොළකම වැසිකිළි ඉදිකිරීම දක්වා වූ විවිධ පරාසයන්ගෙන් යුත් යෝජනා රැසක් විය.

ශ්‍රී ලංකාවේ අයවැය සම්පාදන ක්‍රියාවලිය සැළකීමේ දී, ජාත්‍යන්තර ඇගයීම් මගින් නැවත නැවතත් පෙන්වා දී ඇති හිඩැසක් පිරවීම සඳහා Budget Proposal Hub මහෝපකාරී වේ. 2025 විවෘත අයවැය සමීක්ෂණයට (Open Budget Survey 2025) අනුව, අයවැයේ මහජන සහභාගීත්වය වෙනුවෙන් ශ්‍රී ලංකාව ලබාගෙන ඇත්තේ ලකුණු 100 න් 9 ක් පමණි. එය ලොව පහළම මට්ටමේ කාර්යසාධනයන්ගෙන් එකක් වන අතර, රාජ්‍ය මුදල් උපයන සහ වියදම් කරන ආකාරය හා එහිලා ජනතාවගේ සහභාගීත්වය සහ දැනුවත්භාවය අතර ඇති පරතරය මෙයින් පිළිඹිබු වේ.

Budget Proposal Hub මගින් මහජන සහභාගීත්වය ඉහළ නැංවීම සඳහා ක්‍රමවේද තුනක් සපයයි. පළමුව, වේදිකාවේ ඇති නිල අයවැය යෝජනා ආකෘති පත්‍රය භාවිතා කරමින් මෙම වේදිකාව හරහා සම්පූර්ණ යෝජනාවක් ඉදිරිපත් කිරීමට සහභාගිවන්නන්ට හැකියාව ඇත. දෙවනුව, Budget Proposal Hub හි පළ කිරීම සඳහා සංකල්ප ඉදිරිපත් කළ හැකි අතර, ඒවා සම්පූර්ණ යෝජනාවක් ලෙස සකස් කර ගැනීමට සහාය ලබා ගැනීමටද හැකියාව තිබේ. තෙවනුව, ප්‍රජාතන්ත්‍රවාදී මහජන සහභාගීත්වය ප්‍රවර්ධනය කරමින්, වේදිකාවේ දැනටමත් පළ කර ඇති යෝජනා සඳහා ඡන්දය ප්‍රකාශ කිරීමටද සහභාගිවන්නන්ට අවස්ථාව හිමි වේ.

මෙම වේදිකාව වෙත publicfinance.lk වෙබ් අඩවිය ඔස්සේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන්ම පිවිසිය හැකිය. 2027 අයවැය සඳහා වූ මහජන යෝජනා 2026 අගෝස්තු 31 වන දින දක්වා භාරගන්නා අතර, වැඩිදුර තොරතුරු සඳහා හෝ මෙම වැඩසටහනට සහාය දැක්වීම සඳහා pfp@veriteresearch.org වෙත ඔබේ අවශ්‍යතාවය යොමු කළ හැකිය.